**බොරලැස්ගමුව නගර සභාව - 2020**

**------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**---------------------------------**

බොරලැස්ගමුව නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට බොරලැස්ගමුව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා**

-------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

---------------------------------------------------------------------------

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම**

----------------------------------------------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අංක 2155/7 හා 2019 දෙසැම්බර් 24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පනවන ලද නගර සභා මූල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබඳ රීති අංක 84 හා පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය -2017 අනුව නගර සභාව විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සිදුකර නොතිබූ අතර ගිණුම් පවත්වාගෙන යාමට අවශ්‍ය ආකෘති පත්‍ර හා කේත අංකද භාවිතා කර නොතිබුණි. | 2020 අයවැය ප්‍රමිත අනුව සකසා ඇති අතර ඊට අදාළ ආකෘති හා කේත අංක භාවිතා කර ඇති බවත් 2021 වර්ෂයේ සිට නියමිත ආකෘති පත්‍ර හා කේත අංක භාවිතා කරමින් ප්‍රමිත අනුව කටයුතු කරන බව දන්වමි. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත හා අංක 2155/7 හා 2019 දෙසැම්බර් 24 දිනැති ගැසට් පත්‍රයේ රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ආ) ප්‍රවර්තන මූල්‍ය කාලපරිච්ඡේදයේ ඉදිරිපත් කර ඇති සියළුම වටිනාකම් සඳහා, පෙර වූ සමාන කළ හැකි කාලපරිච්ඡේදයට සම්බන්ධ තුලනාත්මක තොරතුරු නගර සභාව විසින් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි. | 2019 වසරේ පැරණි ගිණුම් ක්‍රමයට ගිණුම සකසා ඇති බැවින් පෙර වර්ෂයේ තොරතුරු ඇතුළත් කිරීමට අපහසු වී ඇති බවත්වර්ෂයේදී ගිණුම 2021 ඉදිරිපත් කිරීමේදී පූර්ව වර්ෂවල තුලනාත්මක තොරතුරු ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | තුලනාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 6.15 ඡේදය අනුව පිළිගත හැකි ක්ෂය කිරීමේ ක්‍රමයක් සභාව විසින් තීරණය නොකර ඉන් බැහැරව කටයුතු කිරීම නිසා 2020 වර්ෂයේ ක්ෂයවීම් ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම් 2020 වසරේදී ප්‍රත්‍යාගණනය කිරීම සිදු කළ හෙයින් 2021 අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ඈ) | රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී සන්සන්දනය කිරීමට පහසුවන ආකාරයට සත්‍ය, අයවැයගත හා පෙර වර්ෂයේ සත්‍ය තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි. | මේ පිළිබඳව තීරණ හා නියෝග මෙතෙක් ලැබී නොමැති හෙයින් මෙම ක්‍රමය අනුගමනය කර නොමැති බවත් 2021 වර්ෂයේ අවසන් ගිණුමෙන් සැකසීමට කටයුතු කරන බවත් දන්වමි. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

**1.6.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිණුම් ප්‍රතිපත්ති යටතේ දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමට භාවිතා කළ පදනම, භාවිතා කළ ක්ෂය කිරීමේ ක්‍රම, තොග අගය කිරිම, අයභාර හා වියදම් හඳුනා ගැනිම ආදිය පිළිබඳ හෙළිදරව් කර නොතිබුණි. | අතපසුවීමකින් ගිණුම සමඟ ඉදිරිපත් කිරීමට නොහැකි වූ බවත් මේ සමඟ අදාළ විස්තර ඉදිරිපත් කරන බවත් දන්වමි. | ප්‍රමිත ප්‍රකාරව සියළු වැදගත් ගිණුම් ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතුවේ. |
| (ආ) | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනැති හා අංක 4/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ උපදෙස් පරිදි, ආයතනය සතු සියලු ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත් සභාව ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. 2021 අවසාන ගිණුම සැකසීමේදී අඩුපාඩු නිවැරදි කරන බව දන්වමි. | සියළුම ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කළ යුතුවේ. |

**1.6.3 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේ ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනිම වෙනුවෙන් දරන ලද රු.61,625,209 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කිරීමෙන් තොරව ආදායම් වියදම් ගිණුමේ ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ලීබඩු හා උපකරණ ගිණුමට රු.1,521,819 ක් ඇතුළත් කර ඇති අතර ඉතිරි ප්‍රාග්ධන වත්කම් 2021 වර්ෂයේ ගිණුම සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු.22,470,773 ක් ලැබී තිබුණද විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ සටහන් අංක 10 යටතේ | පිළිගනිමි .එය ඖෂධ මිලදී ගැනීම සඳහා වූ ප්‍රදානයක් වන අතර අතපසුවීමකින් | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | රු.22,538,480 ක් දක්වා තිබීමෙන් රු.67,707 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | සටහන් අංක 10 යටතේ දක්වා ඇත. 2021 අවසාන ගිණුම සැකසීමේදී නිවැරදි කරන බව දන්වමි. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළ ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකමින් සියයට 10 ක ප්‍රමාණය එනම් රු.2,247,077 ක් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ දැක්විය යුතු වුවත් රු.20,117,129 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති බැවින් රු.17,870,052 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි. 2021 අවසාන ගිණුම සැකසීමේදී නිවැරදි කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඈ) | ප්‍රාග්ධන ප්‍රදාන යටතේ සටහන් අංක 10 හා 5 ගැලපීමෙන් පසු ඉතිරි වටිනාකම වත්කම් හා වගකීම් ප්‍රකාශනයේ හඳුනා නොගත් ප්‍රාග්ධන ප්‍රදාන යටතේ රු.20,223,696 ක් දක්වා නොතිබුණි. | පිළිගනිමි. අවසාන ගිණුම සැකසීමේදී නිවැරදි කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඉ) | 2020 වර්ෂය තුළ සභා අරමුදලින් රු.26,111,676 ක් වැයකර ව්‍යාපෘති 34 ක වැඩ නිමකර තිබුණද එම ව්‍යාපෘතිවල වටිනාකම දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2021 වර්ෂයේදී අදාළ විස්තර ලබා ගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව දන්වමි. | ඉදිකිරීම් අවසන් ව්‍යාපෘති ප්‍රාග්ධනිත කළ යුතුවේ. |
| (ඊ) | සභා අරමුදලින් ක්‍රියාත්මක නොනිමි ව්‍යාපෘති 04 ක වටිනාකම තක්සේරු කර නොනිමි වැඩ යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2021 වර්ෂයේදී අදාළ විස්තර ලබා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වමි. | කෙරීගෙන යන වැඩ නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (උ) | 2019 දෙසැම්බර් 31 දිනට පවතින දේපළ, පිරියත හා උපකරණ ගිණුමේ ශේෂය සංචිත හා වෙන් කිරීමේ ගිණුමට මාරු කර නව දේපළ, පිරියත හා උපකරණ වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය සංචිත හා වෙන් කිරීම් ගිණුමට මාරු කර ඇති අතර දේපළ, පිරියත හා උපකරණ ගිණුමේ ශේෂය 2021 වසරේදී සංචිත හා වෙන් කිරීම් ගිණුමට මාරු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඌ) | දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර 2020 ජනවාරි 01 දිනට ශේෂය ඉදිරියට ගෙන යා යුතු වුවද ඇතැම් වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමෙන් තොරව පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙනා ශේෂයම ගිණුම්ගත කර තිබූ අතර ඇතැම් වත්කම් ගිණුම්ගත කරද නොතිබුණි. | පිළිගනිමි. 2021 අවසාන ගිණුම සැකසීමේදී නිවැරදි කරන බව දන්වමි. | සියළු දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (එ) | ඖෂධ මිලදී ගැනීම සඳහා ලද රු.67,707 ක් පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන යටතේ ගිණුම් ගත කළ යුතු වුවද එම වටිනාකම ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි. 2021 අවසාන ගිණුම සැකසීමේදී නිවැරදි කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඒ) | සමාලෝචිත වර්ෂය තුළ ගලිබවුසර් සේවාව ලබා දී තිබු ආයතන 03 කින් ලැබිය යුතු මුදල් රු.20,160 ක් ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගනිමි. 2021 අවසාන ගිණුම සැකසීමේදී නිවැරදි කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඔ) | මුද්දර ආදායම ලෙස වර්ෂය තුළ රු.50,007,624 ක් ලැබී තිබුණද මූල්‍ය ප්‍රකාශනවල එය රු.61,461,624 ක් වශයෙන් දැක්වීම නිසා මුද්දර ආදායම රු.11,454,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම සැකසීමේදී සිදු වූ ප්‍රමාද දෝෂයකි. 2021 අවසාන ගිණුම සැකසීමේදී නිවැරදි කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඕ) | පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ලබා දී තිබු කම්පැක්ටර් 02 හි ණය වාරික මුද්දර ආදායමෙන් අඩුකර අයකරගෙන තිබුණද ඊට අදාළ සටහන් නිවැරදිව ගිණුම්ගත නොකිරීම නිසා 2019 හා 2020 වර්ෂයන්හිදී ණයහිමියන් යටතේ රු.13,139,466 ක් දක්වා තිබුණි. | අදහස් දක්වා නොමැත. | ශේෂ තහවුරුවක් ලබා ගෙන නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ක) | මූල්‍ය ප්‍රකාශන අනුව මුදල් ශේෂය රු.13,602,463 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව අවසන් මුදල් ශේෂය රු.125,561,405 වුයෙන් රු.111,958,942 ක වෙනසක් පැවතුණි. | පිළිගනිමි. 2021 අවසාන ගිණුම සැකසීමේදී නිවැරදි කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ග) | 2020 වර්ෂයේ මිලදී ගත් රු.134,084 ක් වටිනා පුස්තකාල පොත් හා රු.1,521,818 ක් වටිනා ලීබඩු හා උපකරණ වැරදීමකින් සංචිත හා වෙන්කිරීමේ ගිණුමේ බැරට සටහන් කිරීම නිසා සංචිත හා වෙන්කිරීමේ ගිණුම රු.1,655,902 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 අවසාන ගිණුම සැකසීමේදී නිවැරදි කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඝ) | සමුච්චිත අරමුදලේ පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙනා ආරම්භක ශේෂය රු.136,116,047 ක් වුවද රු.136,055,341 ක් ලෙස දැක්වීමෙන් රු.60,706 ක වෙනසක් පැවතුණි. | 2021 අවසාන ගිණුම සැකසීමේදී නිවැරදි කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.8,284,095 ක් වූ ගිණුම් විෂයයක් සඳහා අවශ්‍ය උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | විවිධ තැන්පත් උපලේඛන සකස් කර 2021 ජූනි 01 දිනට ප්‍රථම විගණනය සඳහා ඉදිරිපත් කරමි. | විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.2,887,122 ක් වූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.76,870,331 ක් විය.

### 2.2. ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| | සමාලෝචිත වර්ෂය සඳහා බිල් කරන ලද වරිපනම් බදු ආදායම රු.27,250,079 ක් වුවද ඉන් රු. 10,050,075 ක් හෙවත් සියයට 37 ක් වර්ෂය තුළ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | 2020 වර්ෂයේ බිල් කළ ආදායමෙන් වරිපනම් බදු සියයට 63 ක් අය කරගෙන ඇත. ප්‍රවර්ථන වර්ෂයේ අවසාන කාර්තුව සඳහා හිඟ හිටි වරිපනම් බදු වෙනුවෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට හැකි වනුයේ එළඹෙන වර්ෂයේ පළමු මස 10 වෙනිදාට පෙරය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | **කුලී** | | |
| | සමාලෝචිත වර්ෂය සඳහා බිල්කළ වෙළඳ ස්ථාන කුලී ආදායම රු. 990,300 ක් වුවද ඉන් රු.760,023 ක් අයකරගෙන තිබුණද රු.132,839 ක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | සමාලෝචිත වර්ෂයේ බිල් කළ වෙළඳ ස්ථාන කුලියෙන් සියයට 76 ක් අය කර ගන්නා ලදී. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | **බලපත්‍ර ගාස්තු** | | |
| | 2012, 2013, 2014, 2017 හා 2018 වර්ෂයන්ට අදාළව හිඟ කර්මාන්ත බදු ආදායම වූ රු.53,000 ක් සමාලෝචිත වර්ෂය තුළදීද අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | නෛතිකව අයකර ගත නොහැකි හිඟ ආදායම් සේ කපා හැරීමට සාධාරණීකරණ වාර්තාවක් ලබා ගැනීමෙන් අනතුරුව කටයුතු කරන බව දන්වමි. | අදාළ කාලපරිච්ඡේදයේදී ආදායම් අයකර ගත යුතුවේ. |